# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2442/63 – 2025 ජුනි මස 28 වැනි සෙනසුරාදා – 2025.06.28**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2021/182.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2023.12.04 දිනැති හා අංක 2361/05 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.11.30 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් තිස්සමහාරාමය, දෙබරවැව, ගහසිරිපුර, අංක 499 හි පදිංචි පී. එම්. ජයන්ත මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් 1. කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය 2. කතරගම, කතරගම ඩිපෝව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 83/2023 හා 2025.06.04 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුනි මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.

නඩු අංකය - A/83/2023
යොමු අංකය - IR/COM/02/2021/182

පී. එම්. ජයන්ත මයා,
අංක 499,
ගඟසිරිපුර, දෙබරවැව,
තිස්සමහාරාමය.

*පළමු පාර්ශ්වය*

01. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

02. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
කතරගම ඩිපෝව,
කතරගම.

*දෙවන පාර්ශ්වය*

අතර පවතින ආරාවුල

**ප්‍රදානය**

(1) කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2023.11.30 වන දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට, මා වෙත යොමු කර ඇත.

(2) **ආරාවුලට හේතුවී ඇති කාරණය -** බේරුම්කරණය සඳහා මා වෙත යොමුකොට ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ,

“ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කොන්දොස්තරවරයෙකු ලෙස සේවය කළ පී. එම්. ජයන්ත මහතාට පහත සඳහන් කරුණු මගින් අසාධාරණයක් සිදුවී තිබේද -

01. පී. එම්. ජයන්ත මහතා සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියදුරු එල්. ඩී. කුලසුන්දර මහතා අතර ඇති වූ ඩබරයක් සම්බන්ධව දෙදෙනාට එක හා සමාන විනය නියෝගයක් ලබා දී තිබියදී පී. එම්. ජයන්ත මහතාට සහන ලබානොදී එල්. ඩී. කුලසුන්දර මහතාට පමණක් සහන ලබාදීම.

02. පී. එම්. ජයන්ත මහතා විනය නියෝගය මගින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කතරගම ඩිපෝවේ සිට අම්බලන්තොට ඩිපෝවට ස්ථාන මාරු කිරීම.

03. ස්ථාන මාරු කරන ලද අම්බලන්තොට ඩිපෝවට සේවයට වාර්තා කිරීමට නොදීම නිසා දින 14ක් වැටුප් අහිමි කිරීම.

04. ඉහත දින 14 ක වැටුප් අහිමි කිරීම නිසා 2020 වර්ෂයේ බෝනස් මුදල් අහිමිවීම.

එසේ අසාධාරණයක් සිදුව තිබේනම් පී. එම්. ජයන්ත මහතාට ලබාදිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ.”

(3) ඒ අනුව බේරුම්කරණ විභාගය 2024.01.08 දින ආරම්භකොට අවසන්වරට නඩු විභාගය සඳහා 2025.01.17 දින දෙපාර්ශ්වය කැඳවන ලදී.

පළමුවන පාර්ශ්වය සඳහා A1 - A සිට A1 - W දක්වා, A1 - Y සිට A1 - Y4 දක්වා, A2 - A සිට A2 - D දක්වාත් දෙවන පාර්ශ්වය X1 සිට X7 දක්වා ලේඛන පරීක්ෂණ විභාගයේදී ලකුණුකොට ඉදිරිපත් කර ඇත. ඒ අනුව දෙපාර්ශ්වය විසින් කරුණු ඉදිරිපත් කළ කාර්ය සටහන් වාර්තාගත කරනු ලැබූ සාක්ෂි දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත සැලකිරීම් සියල්ල ඉතා සැලකිල්ලෙන් අධ්‍යයනයකොට මෙම ප්‍රදානය පිරිනමමි.

(4) **පෙනීසිටීම:**

මා විසින් පරීක්ෂණය පැවැත්වූ සෑම දිනකම මෙහි සහනය පතන ජයන්ත මහතා පරීක්ෂණයට සහභාගි විය. පළමු පාර්ශ්වය වෙනුවෙන් පී. එම්. තිලකසිරි මහතා සහ එම්. කේ. හේමපාල මහතා ද දෙවන පාර්ශ්වය වෙනුවෙන් නීති නිලධාරි ශානිකා ගාල්ලගේ මහත්මිය ද නීතිඥ රයිදා රිස්වි මෙනෙවිය ද පෙනී සිටින ලදී.

(5) **පළමු පාර්ශ්වයේ ස්ථාවරය:**

I. 2016.09.11 දින තමාට එල්. ඩී. කුලසුන්දර නම් අයකු විසින් පහරදීම ඇතුළු ශ්‍රී ලංගම කතරගම ඩිපෝව තුළ සිදුවන අක්‍රමිකතා 06 ක් සම්බන්ධයෙන් 2016.09.27 දින සිදුකළ පැමිණිල්ලක් පිළිබඳව වසර 03 කට ආසන්න කාලයක් ක්‍රියා නොකොට නිද්‍රාශීලීව සිට එහි සඳහන් වූ කාරණා 06 අතරින් පහරදීමේ සිද්ධිය පිළිබඳව වන කාරණය පිළිබඳ පමණක් විමර්ශනය කළ බව,

II. පැමිණිල්ල සිදුකළ තමාව ද දෙවන විත්තිකරු කරමින් තමාට හා වගඋත්තරකරුට ද චෝදනා පත්‍රයක් නිකුත්කොට වරදකරු කරමින් දෙදෙනාටම දින 07 ක වේතන දඩයක් සමග ශ්‍රී ලංගම අම්බලන්ගොඩ ඩිපෝවට ද වගඋත්තරකරු තංගල්ල ඩිපෝවට ද ස්ථාන මාරු කළ බව,

III. ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාවේ 10.02.03 වගන්තියේ දෙවන ඡේදයට පටහැනිව වගඋත්තරකරුගේ දඬුවම් මාරුව අවලංගු කළ බව.

IV. නමුත් වෘත්තිය සමිති නියෝජිතයකු ලෙස අක්‍රමිකතා හෙළිදරව් කිරීම පදනම් කරගෙන තමාට දඬුවම් පමුණුවන ලද නමුත් විනය නියෝගයට ගරු කරමින් තමා වැඩ භාරගැනීමට අම්බලන්තොට ශ්‍රී ලංගම ඩිපෝව වෙත ගිය ද වැඩ භාර ගැනීමට ඉඩ ලබා නොදුන් බව.

V. දින 14 කට පසුව තමා විසින් සිදුකළ ඉල්ලීමක් මත ගරු අමාත්‍යතුමාගේ හා වෘත්තිය සමිතියක මැදිහත්වීම නිසා වැඩ භාරගැනීමට දින 14 කට පසු අවස්ථාව ලද බව

VI. එකී දින 14 ක කාලසීමාව සඳහා වන වැටුප් සහ එයට අනුරූපීව ලැබිය යුතු වාර්ෂික ප්‍රසාද දීමනා අහිමිකළ බව,

VII. එකම සිද්ධියක් මත සිදුකල විමර්ශනයෙන් අනතුරුව ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාවද උල්ලංඝනය කරමින් වගඋත්තරකරුට ලබාදුන් දඬුවම් මාරුව අවලංගු කළද එකී විනය ව්‍යවස්ථාවේ 10.2.3 වගන්තියේ 3 වන ඡේදය ප්‍රකාරව ස්ථාන මාරු ලැබූ සේවා ස්ථානයේ මාස 6ක සේවා කාලයකින් පසුව පළමු සේවා ස්ථානයට ස්ථාන මාරු ලබා පැමිණීමට ප්‍රතිපාදන සළසා ඇතත් ඒ සඳහා ඉල්ලීම් කළද පලිගැනීමේ චේතනාවෙන් මේ දක්වා ප්‍රතිචාර දක්වා නොමැති බව.

VIII. එමගින් අයුතු සහගත ලෙස හා අසාධාරණ ලෙස ක්‍රියාකොට වෘත්තීය සමිති ලේකම්වරයෙකු වන තමාට චේතාන්විතව ක්‍රියාකරමින් අනවශ්‍ය නඩු හබවල පටලවා පීඩාවන්ට පත්කර ඇති බව.

(6) **දෙවන පාර්ශ්වයේ ස්ථාවරය:**

පළමු පාර්ශ්වය කතරගම ඩිපෝවේ බස් රථ කොන්දොස්තරවරයෙකු ව සිටියදී 2016.09.11 දින කතරගම ඩිපෝවේ සේවය කරන රියදුරෙකු වන එල්. ඩී. කුලසුන්දර නම් රියදුරු සමඟ තිස්සමහාරාම බස්රථ ගාලේදී ඇතිකර ගන්නා ලද ගැටුමක් හේතුවෙන් 2019.08.08 දින චෝදනා පත්‍රයක් නිකුත්කොට ඒ යටතේ සිදු කළ විනය විභාගය අනුව වරදකරුවීම අනුව දඬුවම් වශයෙන් දින 07ක වේතන දඩයක් සමග අම්බලන්තොට ශ්‍රී ලංගම ඩිපෝවට ස්ථාන මාරු කරන ලද බවත් එම විනය නියෝගයට එරෙහිව ඔහු විසින් සිදු කළ අභියාචනය සළකා බලා පළමු විනය නියෝගයෙන් නියම කළ ස්ථාන මාරු නියෝගය එලෙසම තිබියදී දඩයක් ලෙස නියම කළ දින 07ක වේතන දඩය දින 03ක වේතන දඩයක් ලෙස නියම කළ බවත් ශ්‍රී ලංකා ගමනාමගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථාව ප්‍රකාරව එකී විනය නියෝගය ක්‍රියාත්මක කර ඇති බැවින් අයුක්ති සහගත සහ අසාධාරණ ක්‍රියාවක් සිදු කර නොමැති බවත් සහ පළමු පාර්ශ්වය අම්බලන්තොට ඩිපෝවේ සිටියදී සිදුකරන ලද විෂමාචාරයක් හේතුවෙන් එයට අදාළව අභ්‍යන්තර විනය පරීක්ෂණයක් දැනටද පවතින බවත් දෙවන පාර්ශ්වයේ ස්ථාවරය වේ.

(7) **නිරීක්ෂණ:**

A. පළමු පාර්ශ්වය විසින් සිය ඉල්ලීම සාධාරණීය සඳහා පදනම් කරගත් කරුණු පහත සඳහන් පරිදි වේ.

(i) තමා සිය සේවා ස්ථානයෙහි වෘත්තීය සමිති නායකයෙකු ලෙස ක්‍රියා කරන බව,

(ii) ඒ අනුව තමාට පහරදීමක් සහ සේවා ස්ථානයෙහි සිදුව ඇති අක්‍රමිකතාවයන් 06ක් සඳහන් කරන ලද පැමිණිල්ලක් 2016.09.17 දින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කළ බව,

(iii) වසර 03ක් තිස්සේ ඒ පිළිබඳ ක්‍රියා නොකොට පහරදීමේ සිද්ධිය පමණක් ඉස්මතුකොට මූලික පරීක්ෂණ පවත්වන ලද බව,

(iv) එය සදාචාර විරෝධී හා කුමන්ත්‍රණකාරී පරීක්ෂණයක් බව,

(v) එකී මූලික පරීක්ෂණය අනුව පැමිණිලිකාර ජයන්ත මහතා සහ තමාට පහර දුන් බව කියන කුලසුන්දර මහතා ද වරදකරු කරමින් ඉදිරිපත් කරන ලද මූලික පරීක්ෂණ වාර්තාව අනුව සිදුකළ විනය විභාගය අනුව දෙදෙනාටම දින 07ක වේතන දඩයක් සමග ස්ථාන මාරුව ලබා දුන් බව,

(vi) පසුව ජයන්ත මහතා ස්ථාන මාරු ලද සේවා ස්ථානය වන අම්බලන්තොට ඩිපෝවට සේවා වාර්තා කිරීම පිණිස ගිය ද ස්ථාන මාරු ලිපියක් නොලද බව පවසමින් ඒ සඳහා දින 14ක් යනතුරු සේවයට වාර්තා කිරීම සඳහා අවස්ථාව ලබා නොදුන් බව සහ එම කාලයට අදාළ වැටුප් නොගෙවන ලද බව සහ එයට අනුරූපි වන බෝනස් මුදල නොගෙවූ බව,

(vii) මාස 06ක සේවා කාලයකින් පසුව පළමු සේවා ස්ථානයට ස්ථාන මාරුවීම් ලැබීමට හිමිකම් ඇතත් තමාට ඒ සඳහා අවස්ථාව ලබා නොදුන් නමුත් මුල් අවස්ථාවේම කුලසුන්දර මහතාගේ ස්ථාන මාරුව අවලංගු කරමින් ඔහුට මුල් සේවා ස්ථානයේම සේවය කිරීමට අවස්ථාව ලබා දුන් බව,

B. මේ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය විසින් අනුගමනය කළ ක්‍රියා පටිපාටිය සාධාරණීකරණය කරමින් පහත කරුණු ඉදිරිපත් කරයි.

(i) අදාළ විනය නියෝගයට එරෙහිව ඉදිරිපත් කළ අභියාචනයක් ප්‍රකාරව දින 07 ක වේතන දඩය දින 03ක් දක්වා අඩු කළ බව,

(ii) ශ්‍රී ලංගම සියළුම සේවකයින් ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාවට අනුව පාලනය වන බැවින් ඒ අනුව අභ්‍යන්තර විනය පරීක්ෂණයක් පවත්වා එහි විනය නියෝගය ප්‍රකාරව ක්‍රියා කර ඇති හෙයින් දෙවන පාර්ශ්වය විසින් කිසිදු ආකාරයක අසාධාරණ හා අයුක්ති සහගත ක්‍රියාවක් සිදු කර නොමැති බව,

(iii) පළමු පාර්ශ්වය තවදුරටත් අම්බලන්තොට ඩිපෝවේ සේවය කරමින් සිටියදී සිදු කරන ලද විෂමාචාරයක් හේතුවෙන් අභ්‍යන්තර විනය පරීක්ෂණයක් ආරම්භ කර ඇති බව,

(8) **නිගමන:**

(i) ඒ අනුව දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන කරුණු අනුව ජයන්ත මහතා සම්බන්ධයෙන් පවත්වන ලද මූලික විමර්ශනය සහ ඒ අනුව ලබාදුන් විනය නියෝගයත් සහ එයට අදාළව සිදුකළ අභියාචනය අනුව සිදුකළ විනය නියෝගයේ සංශෝධනයන් පිළිබඳව කිසියම් දෝෂයක් බේරුම්කරණයට නිරීක්ෂණය නොවේ.

(ii) තමාට සේවයට වාර්තා කිරීමට ඉඩ ලබානොදීම අනුව ජයන්ත මහතා විසින් කතරගම පොලීසිය වෙත 2020.12.20 දින සිදු කළ පැමිණිල්ල A1(1) ලෙස ද, අම්බලන්තොට පොලීසිය වෙත 2020.12.27 දින සිදු කළ පැමිණිල්ල A1(M) ලෙස ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2020.12.22 දින සිදු කළ පැමිණිල්ල A1(A1N) ලෙස ද, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති ඇතුළු නිලධාරීන්ට හා ප්‍රවාහන අමාත්‍යවරයාට පිටපත් සහිතව 2020.12.24 දින ඉදිරිපත් කළ පැමිණිල්ල A1(O) ලෙස ද, ඉදිරිපත් කර ඇත. එයට අමතරව ඩිපෝවේ ආරක්ෂක අංශය වෙත ද පැමිණිලි කළ බව කියා සිටී. එමඟින් පෙනී යන්නේ නව සේවා ස්ථානයෙහි සේවා වාර්තා කිරීම පිණිස පැමිණිලිකරුට පැවති බලවත් අවශ්‍යතාව වේ.

(iii) තවද සේවයට වාර්තා කිරීමට පැමිණි අවස්ථාවේ සේවයට වාර්තා කිරීමට ඉඩ ලබා නොදීමට පාදක වූ කිසිදු සාධාරණ හේතුවක් දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර නැත. මේ අනුව පැමිණිලිකරු වන ජයන්ත මහතාට 2012.12.19 දින සිට 2020.12.31 දින දක්වා සේවයට වාර්තා කිරීමට නොහැකිවීම ඔහුගේ පාලනයෙන් තොර හේතුවක් මත සිදුව ඇත.

(iv) එසේම එකම සිද්ධියක් සම්බන්ධයෙන් දෙපාර්ශ්වයටම සමාන දඬුවම් සහිත විනය නියෝගයක් නිකුත් කර තිබියදී කුලසුන්දර මහතාගේ ඉල්ලීම පමණක් සළකා ඔහුගේ ස්ථාන මාරුව අවලංගු කිරීම විනය ව්‍යවස්ථාවේ 10:2:3 වගන්තිය උල්ලංඝනය කිරීමක් බවට ඉදිරිපත් කර ඇති කාරණයත් නව සේවා ස්ථානයට ස්ථාන මාරු ලැබීමෙන් පසු විනය ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව සිදු කළ ඉල්ලීම පරිදි ජයන්ත මහතාට සිය නිවසට ආසන්න සේවා ස්ථානයට ස්ථාන මාරු ලබා නොදීමත් යන පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කළ කරුණු බේරුම්කරණය විසින් සැළකිල්ලට ගන්නා ලද අතර එකම සේවා ස්ථානයක සේවය කළ සේවකයින් දෙදෙනෙකුට අසමාන අයුරින් දෙයාකාරව සැලකීමක් ලෙස බේරුම්කරණයට නිරීක්ෂණය වේ.

(v) දෙපාර්ශ්වය මගින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව ජයන්ත මහතා වෘත්තිය සමිති ක්‍රියාකාරකම්වල යෙදීමත්, ඔහුට විරුද්ධව සිදු කළ මූලික විමර්ශනයට පදනම් වූ A1(C) ලෙස ඉදිරිපත් කරන පැමිණිල්ලේ සඳහන් සෙසු කරුණු අතහැර පහරදීමට අදාළ වූ හේතුව පමණක් මූලික විමර්ශනය සඳහා පදනම් කර ගැනීමට හේතු වූයේ ඉහළ පරිපාලනයේ නියෝග අනුව බවටත් ඉදිරිපත් කරන A2(C) ලේඛනය අනුව ජයන්ත මහතා සම්බන්ධයෙන් අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග තුළ පළිගැනීමේ චේතනාවක් තිබුණු බවට ඉදිරිපත් කරන කරුණු බැහැර කළ නොහැකිය.

(vi) A1(K) ලෙස ඉදිරිපත් කරන ස්ථාන මාරු නියෝගය පරිදි සේවය සඳහා වාර්තා කිරීමට ගිය නමුත් පාලනාධිකාරිය මගින් එයට අවකාශ ලබා නොදුන් බව සනාථ කිරීම පිණිස A1(L) සහ A1(M) ලෙස සලකුණු කළ පිළිවෙලින් 2020.12.20 හා 2020.12.27 දිනැතිව කතරගම හා අම්බලන්තොට පොලිස් ස්ථාන 2හි සිදු කළ පැමිණිලි ද, A1(N) දරන මානව අයිතිවාසිකම් කොමිෂන් සභාව වෙත සිදුකල පැමිණිල්ල ද, A1(O) දරන විෂය භාර අමාත්‍යවරයා වෙත 2020.12.24 දිනැතිව යොමු කළ පැමිණිල්ල ද ඉදිරිපත් කරන අතර එයට අමතරව සේවයට වාර්තා කිරීමට ඉඩ ලබා නොදුන් බවට එදින අම්බලන්තොට ආරක්ෂක අංශයෙහි ලොග් සටහන් පොතෙහි සටහන් යෙදීමට ඉල්ලීමක් කළ බව සනාථ කිරීම පිණිස එදින ආරක්ෂක අංශයෙහි සේවය කළ අනුර මල්ලිකාරච්චි මහතා කැඳවා සාක්ෂි ලබා ගෙන ඇත. ඔහුගේ සාක්ෂිය අනුව ජයන්ත මහතා විසින් 2020.12.18 දින අම්බලන්තොට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝව වෙත ගිය බව සහ සේවයට වාර්තා කිරීමට ඉඩ නොදුන් බව පවසමින් ආරක්ෂක අංශයේ සටහන් යෙදීමට ඉල්ලීමක් සිදු කළ බව සාක්ෂි ලබා දී ඇත. ඒ අනුව ජයන්ත මහතා 2020.12.18 දින සේවයට වාර්තා කිරීමට නව සේවා ස්ථානය වන අම්බලන්තොට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ඩිපෝව වෙත ගිය බවට ඉදිරිපත් කෙරෙන සාධක බැහැර කළ නොහැකිය. ඒ අනුව එදින සේවයට වාර්තා කිරීමට ඉඩ ලබා නොදීමට ද වෘත්තීය සමිති නායකයෙකු ලෙස ඔහු නොරිස්සුමෙන් සිදු කර ඇති ක්‍රියාවක් බව නිරීක්ෂණය වේ.

(vii) ජයන්ත මහතා සම්බන්ධයෙන් අනුගමනය කළ ක්‍රියා පිළිවෙත සාධාරණීකරණය කිරීම සඳහා දෙවන පාර්ශ්වය ඉදිරිපත් කරන කරුණු වන ස්ථාන මාරුවට අදාළව ජයන්ත මහතා හා කුලසුන්දර මහතා යන දෙදෙනාගෙන්ම ලද අභියාචනා අනුව ඒවා සළකා බලා දින 07ක වේතන දඬය දින 03ක් දක්වා අඩු කළ බවත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ විනය ව්‍යවස්ථාව අනුව සියළුම සේවකයින් ඊට යටත් බවත් පත්වීම් ලිපියේ කොන්දේසි ප්‍රකාරව ස්ථාන මාරුවීම්වලට යටත් බවත් සඳහන් කරන නමුත් කුලසුන්දර මහතාගේ පමණක් ස්ථාන මාරු නියෝගය අවලංගු කිරීම සහ ස්ථාන මාරු නියෝගය අනුව ජයන්ත මහතා නව සේවා ස්ථානයෙහි සේවයට වාර්තාකොට මාස 06කින් පසුව මුල් සේවා ස්ථානයට ස්ථාන මාරුවක් ලබා ගැනීමට සේවා ව්‍යවස්ථාවේ 10:2:3 වගන්තිය ප්‍රකාරව ඉල්ලීම් කළ ද ඒ සම්බන්ධයෙන් මේ දක්වා ක්‍රියා කර නොතිබීමත් නිසා තම පිළිවෙත සාධාරණීකරණය පිණිස ඉදිරිපත් කෙරෙන එම කරුණු පිළිගත නොහැකිය.

(viii) තවද නව සේවා ස්ථානයට සේවා වාර්තා කළ පසු ද ජයන්ත මහතාට එරෙහිව මූලික විමර්ශනයක් ආරම්භ කර ඇති බවට ඉදිරිපත් කරන කාරණය අනුව එම විමර්ශනය මෙතෙක් අවසන් නොවූ විමර්ශනයක් හෙයින් එමගින් ඉදිරිපත් කර ඇති චෝදනාවන්ට වරදකරුද නිවැරදිකරුද යන්න පිළිබඳ අවසන් නිගමනයකට එළඹ නොමැති හෙයින් එයද සැළකිල්ලට ගත නොහැකි කාරණාවකි.

(ix) ඉහත කරුණු අනුව ජයන්ත මහතාට ලබාදුන් ස්ථාන මාරුව අනුව නව සේවා ස්ථානයට වාර්තා කිරීමට ඉඩ නොලැබීම ඔහුගේ පාලනයෙන් බැහැර ක්‍රියාවක් බවටත් එමගින් ජයන්ත මහතා සම්බන්ධයෙන් පමණක් වෙනස් ලෙස ක්‍රියා කර ඇති බවටත් ජයන්ත මහතාට අසාධාරණයක් සිදුව ඇති බවටත් නිගමනය කරමි.

(9) **ප්‍රදානය:**

(i) A1 - Y2 ලෙස සලකුණු කර ඇති ස්ථාන මාරු නියෝගය අනුව අම්බලන්තොට ඩිපෝවේ සේවය සඳහා වාර්තා කිරීමට ඉඩ නොලැබීම මත 20.12.18 සිට 20.12.31 දක්වා දින 14 ක් සඳහා අහිමිවුණු වැටුපට අදාළ රු. 20,849.57ක මුදල සහ එකී දින 14 ක කාලය පඩි රහිත නිවාඩු ලෙස සළකා කටයුතු කර 2020 වසර සඳහා නොගෙවූ රු. 13,500.00 වූ ප්‍රසාද දීමනා මුදල ඉල්ලුම්කරුට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙනුවෙන් ශ්‍රී ලංගම කතරගම ඩිපෝව මගින් ගෙවිය යුතු බව,

(ii) එයට අමතරව බේරුම්කරණ විභාගය සඳහා 24.08.01 සිට 25.01.17 දක්වා කාලය තුළ දින 11ක් යාම් ඊම් කිරීමේදී වැයවූ ගමන් වියදම් හා ආහාර පාන සහ නවාතැන් ගාස්තු වෙනුවෙන් වැය වූ වියදම් සළකා බලා දිනකට රු. 2500.00 බැගින් 2500/- x 11 = රු. 27,500.00 ක මුදලක් ගෙවීමටත්,

(iii) නඩු ගාස්තු වෙනුවෙන් රු. 25000.00 ක මුදලක් ගෙවීමටත් නියම කරමි.

(iv) ඉල්ලුම්කරු සම්බන්ධයෙන් විෂමාචාර ක්‍රියාවකට අදාළව මේ වනවිට විමර්ශනයක් පැවැත්වෙන හෙයින් මේ අවස්ථාවේ ස්ථාන මාරුවීමක් ප්‍රදානයක් ලෙස නියම කිරීම උචිත නොවන බව බේරුම්කරණයට පෙනී යන්නේ නමුදු පැමිණිලිකරු අම්බලන්තොට ශ්‍රී ලංගම ඩිපෝවට සේවයට පැමිණ මේ වනවිට වර්ෂ 04ක් සහ මාස 05කට අධික කාලයක් සේවය කර ඇතත් තමාගේ පූර්වගාමී සේවා ස්ථානයට සාධාරණ හේතුවක් නොමැතිව නැවත ස්ථාන මාරුවීම ලබා නොදීම තුළින් ඔහුට සිදුව ඇති අගතිය සළකා ජයන්ත මහතා දැනට සේවය කරන අම්බලන්තොට ශ්‍රී ලංගම ඩිපෝවේ සිට කතරගම ශ්‍රී ලංගම ඩිපෝව වෙත ස්ථාන මාරු කිරීමක් ලබා දීමද ප්‍රදානයක් ලෙස නියම කරමි.

අදාළ නියමයන් මෙම *ගැසට් පත්‍රයේ* පළවූ දිනයේ සිට එක් මසක් ඇතුළත ක්‍රියාත්මක විය යුතු අතර ප්‍රදානයක් ලෙස නියම කළ මුදල ද එකී දිනයට පෙර නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතුය.

මෙම ප්‍රදානය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව ද ප්‍රකාශ කරමි.

**පී. එච්. ආනන්ද,**
බේරුම්කරු.

2025 ජුනි මස 04 වන දින දී ය.

EOG 06 – 0283

මගේ අංකය: IR/COM/01/2022/77.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.04.04 දිනැති හා අංක 2430/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.03.25 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බණ්ඩාරවෙල, විශාඛා මාවත, අංක 185/ඊ හි පදිංචි එම්. එන්. අබේකෝන් මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 20/2025 හා 2025.06.06 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුනි මස 19 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කාර්මික අධිකරණය - කොළඹ

එම්. එන්. අබේකෝන් මයා
අංක 185/ඊ,
විශාඛා මාවත,
බණ්ඩාරවෙල.

ආරාවුල් අංකය - IR/COM/01/2022/77

පැමිණිලිකරු

එදිරිව

බේරුම්කරණ අංකය - A/20/2025

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

වගඋත්තරකරු

**බේරුම්කරණ තීන්දු ප්‍රකාශය**

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"1983 දී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට බැඳී 1993 දී සී/ස කහගොල්ල ඉංජිනේරු සේවා සමාගමට අනුයුක්ත කරන ලදුව එම සමාගම අක්‍රියවීමෙන් අනතුරුව නැවතත් 2004 සී/ස ඌව බස් සමාගමට අනුයුක්ත කරන ලදුව ඒ වනවිට දැරූ උසස්වීම්වලට අදාළ අනුරූපී වැටුප ද ගෙවා ඇති,

1. එම්. එන්. අබේකෝන් මහතාව 2020.10.20 දින විශ්‍රාමයාමේදී 1983 දී දැරූ II පෙළ කාර්මික තනතුර දක්වා පහත හෙළීම.
2. එම්. එන්. අබේකෝන් මහතාට, 2016 වර්ෂයේ සිට වැටුප් වර්ධක හිමි ද හිමි නම් එය ලබා නොදීම සහ
3. ලබා දී ඇති උසස්වීම්වලට අදාළ වැටුප් තලයන්හි නොපිහිටුවීම.

මගින් අසාධාරණයක් සිදුවී තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේ ද යන්නත් පිළිබඳව වේ."

මෙකී පරීක්ෂණය 2025.05.08 දින මුල්වරට කැඳවූ අතර එදින පැමිණිලිකරු පරීක්ෂණයට සහභාගි නොවන බව දන්වා තිබූ අතර පසුව, මෙම බේරුම්කරණයට අදාළ පැමිණිල්ල ඔහු විසින් ඉල්ලා අස්කරගන්නා බවට දැනුම්දෙමින් ලිපියක් ගරු බේරුම්කරණ අධිකරණයට 2025 මැයි 16 දින ලැබී ඇත.

ඒ අනුව පැමිණිලිකරු එම්. එන්. අබේකෝන් මහතාගේ ඉල්ලීම පිළිගනිමින් එකී පැමිණිල්ල මගින් අයැද සිටි සියලු සහන නිශ්ප්‍රභ කරමින් මෙම පැමිණිල්ල ඉල්ලා අස්කර ගැනීමට අවසර දෙමි. බේරුම්කරණ පරීක්ෂණය අවසන් කරමි.

මෙය සාධාරණ සහ යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

**නීතිඥ පියල් දර්ශන ගුරුගේ,**
බේරුම්කරු.

වර්ෂ 2025 ක් වූ ජුනි මස 06 දින දී ය.

EOG 06 – 0284

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.